# ලොව පැවති සාම්ප්‍රදායික දිව්රුම් ක්‍රම හා මහනුවර යුගයේ දිව්රුම් ක්‍රම පිළිබඳ තුළනාත්මක අධ්‍යනයනක්

*පූජ්‍ය ගල්කුලමේ උපරතන හිමි*

**ප්‍රවේශය**

දිවුරීම යන්න 'දිව්' යන නාම ප්‍රකෘතියෙන් සෑදුණු නාම පදයකි. 'දිව්' යන නාම ප්‍රකෘතියෙන් සිංහලයට බිඳුණු වචන රැසකි. ඒ අතරින් දිවුIu yd neදි වචන කිහිපයක් හඳුනාගත හැකිය. දිවුරුම්, දිවුරිලි, දිව්රීම, දිවු, දිව්රනවා, දිවිය, දිව්හිස, දිව් දෝස, දිව් පණම්, දිව් කදුරු, දිව් වාසගම්, දිව් සීට්ටු, ආදිය ඉන් සමහරකි.[1] අදෘශ්‍යමාන බලවේගයක්, පූජනීය ස්ථානයක්, පූජනීය වස්තුවක්, දෙමාපියන්, දූ දරුවන් වැනි ජීව අජීව වස්තු දෙස් වශයෙන් තබා ගෙන තම නිවැරදි බව හා සත්‍යවාදී බව ප්‍රකාශ කිරීමට උත්සහ කිරීම දිවුරීම ලෙස ඉතා සරලව අර්ථ දැක්විය හැකිය. සුමංගල ශබ්දකෝෂයේ දැක්වෙන පරිදි දිවුරීම යනු:

> **"තමන් ප්‍රකාශ කරන ප්‍රකාශයෙහි සත්‍යතාව ප්‍රකාශ කිරීම සඳහා ගරු ගාම්භීරාකාරයෙන් ප්‍රකාශයක් කරනවා, ශපථ කරනවා, දෙවියන් ආදී අතිමානුෂීය බලයක් ඇත්තෙකු හෝ ශුද්ධ වූ වස්තුවක්, ස්ථානයක් දෙස් වශයෙන් තබා ගෙන කරනු ලබන සත්‍ය ප්‍රකාශයයි."**[2]

කිසියම් පුද්ගලයෙකු විසින් කරනු ලබන ප්‍රකාශයක සත්‍යතාව වඩාත් තහවුරු කිරීමට දිවුරන අවස්ථා අපි දැක ඇත්තෙමු. සත්තයි, අම්මාපල්, දෙවියන්පල්, බුදුන්පල්, ආදිය එබඳු දිවුරීමේ අවස්ථා කීපයකි. නිරුක්ති සහිත සිංහල ශබ්දකොෂයෙහි දැක්වෙන පරිදි 'දිව්රීම' යනු තමන් කියන දේ සත්‍ය බවට සහතික කිරීම සඳහා ගාම්භීරතා පූර්වකව ප්‍රකාශ කරනවා, ශපථ කරනවා යන්නයි.[3]

"දිවුරුම" යන්න ඉංග්‍රීසි භාෂාවෙන් හැඳින්වෙන්නේ 'Swear' යනුවෙනි. 'Oath' යන්නද ඊටම සමාන අර්ථයේ යෙදී ඇති පදයකි. ඔක්ස්ෆර්ඩ් *(Oxford)* ශබ්දකෝෂයට අනුව 'Swear' යනු, *"Appeal to a god or other sacred person or thing in confirmation of the truth of a solemn declaration or statement"*[4] මෙයින් අදහස් වන්නේ තමන් කරන ප්‍රකාශයෙහි සත්‍යතාව තහවුරු කිරීම සඳහා ශ්‍රේෂ්ට පුද්ගලයෙකු හෝ වස්තුවක් මුල්කරගෙන කරනු ලබන ප්‍රබල ප්‍රකාශය යන්නයි. ඊට අනුව දිවුරීම තුළ පොරොන්දුවක් අන්තර්ගත වන බව පැහැදිළිය.

දිවුරුම යන්න පාලියේ 'සපථ' යනුවෙන්[5] හැඳින්වෙන අතර සංස්කෘත භාෂාවේ 'ශපථ' යනුවෙන් සඳහන් වේ. සංස්කෘතයේ ඒ සඳහා දී ඇති අර්ථ වන්නේ ශාප කිරීම, ශාපය, දිවුරීම, වශීකරණය යන්නයි.[6]

---

1 **සිංහල ශබ්දකෝෂය**, (කොළඹ: සංස්කෘතික අමාත්‍යංශය, 1985).

2 වැලිවිටියේ සෝරත හිමි, **ශ්‍රී සුමංගල ශබ්දකෝෂය** , (කොළඹ: පී අභයවික්‍රම ප්‍රකාශන.1963).

3 සිරි ලියනගේ, **නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය**, (කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ. 2003).

4 **Oxford Dictionary**, Oxford University Press, 1978).

5 පොල්වත්තේ බුද්ධදත්ත හිමි, **අටුවා පරීක්ෂණය හා අටුවා කථා වස්තු**, (කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,2002).

6 පුවසති අලගියවන්න, **සංස්කෘත සිංහල ශබ්දකෝෂය**, ( කොළඹ: සූරිය ප්‍රකාශකයෝ. 2004).

මෙය දෙමළ භාෂාවේ 'සත්තියප්‍රමාණම්' (சத்தியப்பிரமாணம)[7] යනුවෙන් ව්‍යවහාර කෙරේ. මේ ආකාරයෙන් දිවුරීම යන්න විවිධ භාෂාවල යෙදී සමාන අර්ථ ප්‍රකට කරන බව පැහැදිලිය.

දිවුරීම ලංකාවේ පමණක් භාවිත වූ සංකල්පයක් නොවන බව ලෝක ඉතිහාසය අධ්‍යනය කිරී-මෙන් පැහැදිලි වේ. මධ්‍යකාලින යුගය වන විට දිවුරීම නැමති සංකල්පය ලෝකයේ බෝහෝ රට වල ක්‍රියාත්මක වූ වක් බව ඓතිහාසික සාධක පරීක්‍ෂා කිරීමේදී පැහැදිලිවේ. මධ්‍යකාලින යුරෝපය, අප්‍රිකා-ව,ඕස්ට්‍රේලියාව, මෙක්සිකෝව, ස්කොට්ලන්තය, ග්‍රීසිය, භාරතය ආදී විවිධ රටවල මෙම දිවුරීමේ සං-කල්පය ක්‍රියාත්මක වූ බව පෙනෙන්නට තිබේ. වර්තමානය වන විට දිවුරීම සාමාන්‍ය ව්වහාරයක් බවට පත්ව ඇතත් මධ්‍යකාලය වන විට ඉහත සඳහන් රටවල මෙම සංකල්පයට නෛතික පදනමක් තිබුණ බව පැහැදිලි වේ. මධ්‍යකාලීන ලංකාවේ නීතීය ක්‍රියාත්මක කිරිමේදී විවිධ දිවුරුම් ක්‍රම භානිතා කර ඇති ආකාරය ඓතිහාසික තොරතුරු අධ්‍යනයෙන් පැහැදිලි වේ. ප්‍රධාන වශයෙන් මහනුවර යුගය වන විට යුක්තිය පසිදලීම සඳහා භාවිත කළ ප්‍රධාන දිවුරුම් ක්‍රම අටක් පැවති බව තහවුරු විය. මෙම දිවුරුම් ක්‍රම ප්‍රථමික දිවුරුම් ක්‍රම, ප්‍රාථමික ලක්‍ෂණ පෙන්නුම් කළද තත්කාලීන සමාජ පාලන උපාය විධියක් ලෙස ඊට ප්‍රධාන තැනක් හිමිව තිබූ බව පැහැදිලිය. මෙම ලිපියෙන් අපේක්ෂා කරනුයේ මධ්‍යකාලීන ලංකාවේ පැවති දිවුරුම් ක්‍රම හා සමකාලීන ලෝකයේ රටවල භාවිතා වූ දිවුරුම් ක්‍රම අතර පැවති සමාන අසමානතා තුලනාත්මකව විග්‍රහ කිරීමයි.

## විමර්ශනය

සපථය හෙවත් දිවුරීම නැමති සමාජ සිද්ධාන්තය ශ්‍රී ලංකාවේ පමණක් දක්නට ලැබෙන සංකල්පයක් නොව. එය ලොව බොහෝ රටවල ද ක්‍රියාත්මක වූ සංකල්පයකි. යුරෝපය, අප්‍රිකාව, ආසියාව ආදී කලාප වෙත අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ එම රටවලද සමාජ පාලන උපක්‍රමයක් ලෙස දිවුරීම නැමති සමාජ සංකල්පය භාවිතයට ගත් බවයි. මධ්‍යකාලීන යුරෝපීය සමාජය වෙත අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ විවිධ ගෝත්‍රික සමාජ පාලන බලය ලබා ගැනීම වෙනුවෙන් වෙර දැරූ ආකාරයයි. බටහිර රෝම අධිරාජ්‍යය බිඳ වැටීමෙන් පසු ජර්මන් ගෝත්‍රික පිරිස් බලවත්ව නැඟී සිටින අයුරු දක්නට ලැබුනි. එසේම ප්‍රාදේශීක මට්ටමෙන් බලවත්ව නැගී සිටි ගෝත්‍රික පිරිස්ද මෙම අවධියේදී දක්නට ලැබුණු අතර එහිදී පැන නැගි සිවිල් හා අපරාධ ආරවුල් විසඳීමට වංශාධිපතීන් විසින් දිවුරීම භාවිතයට ගත් බව පෙනෙන්නට තිබේ.

අදෘෂ්‍යමාන බලවේගවල බලපෑමෙන් දේව විනිශ්චය ලබා ගැනීමට පෙළඹුණු අයුරු මෙම අවධියේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි. විශේෂයෙන්ම "දෙවියන් වහන්සේ විසින් එය ඔප්පුකරනවා ඇත" (දෙයියන්ට ඔප්පුවෙච්චාවේ) යනුවෙන් එය දෙවියන්ට භාර කළ බවක් පෙනෙන්ට තිබේ. කෙනෙකුගේ නිර්දෝෂීභාවය ඔප්පු කිරිම සඳහා ක්‍රම 03ක් යුරෝපීයයන් භාවිත කළ බව R.J. Walker නම් ලේඛකයා සඳහන් කරයි.[8] ඔහු සඳහන් කරන ආකාරයට නීතිය වූ කලී සමාජය සංවරව තබා ගැනීම හා පාලනය කිරීම සඳහා ඇති එකම ක්‍රමය නොවේ. එය වූ කලී ආරවුල් නිරවුල් කර ගැනීම සඳහා යොදා ගන්නා ලද්දකි. *(The law was solemnly an instrument of social control functioned as a mechanism of the resolution of the disputes).*[9]

Walker ගේ අදහසට අනුව් උණු වී කැකෑරෙන වතුර බඳුනකට අත දමා ඒ තුළට දමා තිබෙන කුඩා ගල් කැට ඇහිදීමට චූදිතයාට නියම කෙරේ. මෙහිදී නිරායාසයෙන්ම අත පිළිස්සෙන අතර පිළිස්සුණු අත වෙළුම් පටියකින් බැඳ තබනු ලැබේ. නියමිත දින ගණනක් තුළ තුවාල සුව නොවුන හොත් චූදිතයා වැරදිකරුවෙකු ලෙස නිශ්චය කරන ලදි.[10]

මීට අමතරව යුරෝපා සමාජ ක්‍රමය තුළ ක්‍රියාත්මක වන තවත් දේව විනිශ්චය ලබා ගැනීමේ ක්‍රමයක් ලෙස දෙවියන් වහන්සේ විසින් හෝ පල්ලියේ පූජක විසින් ආශිර්වාද ජලය පිරි පොකුණකට හෝ වතුර වළකට චූදිතයා තල්ලු කර, ඒ අනුව ලැබෙන ප්‍රතිඵල මත අධිකරණ විනිශ්චය ලබා දීම

7 ඩබ්ලිව්.එස්. කරුණාතිලක, දෙමළ සිංහල අකාරාදිය, (කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ, (2002).

8 R.J. Walker, **the English legal system** (6th edition London), Butterwortts, 1885).

9 එම

10 පී.ඩබ්. ජයතිලක, **නීතිය සහ නීතියේ ඉතිහාසය**, (කතෘ ප්‍රකාශන. 2012).

දක්විය හැකිය. මෙහිදී චූදිතයා ජලයේ පාවී යන්නේ නම් වැරදිකරු වේ. ජලයේ ගිලා බසින්නේ නම් නිර්දෝෂී ලෙස සලකන ලදි.[11]

ආරවුල් සම්බන්ධ පාර්ශවයන් වෙත සාධාරණ විනිශ්චයක් ලබා දීමට අපහසු අවස්ථාවල අධිකරණ විනිශ්චය ලබාදීමට අනුගමනය කරන ලද තවත් විනිශ්චය ක්‍රමයක් ලෙස ගිනියම් කළ යකඩ මත ඇවිද්දවීම දක්විය හැකිය. පාවහන් නොමැතිව වග උත්තරකරු රත් කරන ලද යකඩ කැබලි විසිරූ බිමක් මත ඇස් වසා ගෙන ඇවිදවීමෙන් අධිකරණ විනිශ්චය ලබා දෙන ලදි. මෙහිදී පා පිලිස්සී නැති නම් ඔහු නිර්දෝෂී වේ.[12]

මධ්‍යකාලීන යුරෝපයේ ක්‍රියාත්මක වූ ඉහත දඬුවම් ක්‍රම මගින් පැහැදිලි වන්නේ වේදනාකාරී අත්දැකීමකට පත්කර දේව විනිශ්චය ලබා ගැනීම වූකලී අපගේ ප්‍රස්තුතය වන දිවුරුම් ක්‍රියාවලිය හා සමගාමී වන බවයි. එසේම බරපතල අපරාධ සම්බන්ධව යුක්තිය පසිඳලීමේදී විත්ති පැමිණිලි දෙපක්ෂය අතර සටනක් සිදු කර අවසාන තීරණයකට පිවිසීමද තවත් විනිශ්චය ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක විය. මධ්‍යකාලීන යුගයේ ආරම්භයේ සිට අවසානය දක්වාම මෙම ක්‍රමය ක්‍රියාත්මක වූ අතර නිවැරදිකරුහට දෙවියන්ගේ ඇල්ම බැල්ම මත ජය අත්වේවා යන සංකල්පය මත පිහිටා මෙම ක්‍රමය ක්‍රියාත්මක කරන ලදි.[13] දෙවියන් වහන්සේ සර්ව බලධාරීය යන පදනමේ සිට ඔහුගේ විනිශ්චය තුළින් නිවැරදිකරුට ආරක්ෂාව ලැබෙන බව මෙකල විශ්වාසය විය. යුරෝපීය සමාජ ක්‍රමය තුළ දෙවියන් වහන්සේ පිළිබඳව වූ අචල විශ්වාසය මත පදනම්ව සමාජ පාලන උපක්‍රමයක් ලෙස ඉහත දැක්වූ ක්‍රමවේද අනුව දේව විනිශ්චය ලබා ගැනීම සිදු විය.

යුරෝපීය අධිකරණ ක්‍රමය තුළද විත්ති පැමිණිලි දෙපක්ෂයටම තම නිරවද්‍යතාව තහවුරු කරලීම සඳහා ''දිවුරුම් ප්‍රකාශ'' නිකුත් කිරීමේ අවකාශය සැලසී තිබිණි. මෙය සිදුවූයේ අසල් වැසියන් තමාගේ නිරවද්‍යතාව දිවුරුම් ප්‍රකාශන මඟින් ඉදිරිපත් කිරීමයි. මෙහිදී විනිශ්චය ලබා දෙනු ලැබුවේ චූදිතයා හා පැමිණිලිකරු සම්බන්ධයෙන් දෙපාර්ශවයෙන්ම ඉදිරිපත් වන දිවුරුම් ප්‍රකාශන සංඛ්‍යාව අනුවය. ඒ අනුව වැඩි දිවුරුම් ප්‍රකාශන සංඛ්‍යාවක් ඉදිරිපත් කරන පක්ෂය නිවැරදිකරු ලෙස සලකන ලදි. මෙලෙස දිවුරුම් ප්‍රකාශන මඟින් අධිකරණ විනිශ්චය ලබා ගැනීම 13වන සියවස තරම් වූ ඈත අතීතයට දිව යනු ලැබේ. නමුත් යුරෝපා රටවල වර්තමානයේ පවත්නා නෛතික රාමුව තුළ ඉදිරිපත් කරන දිවුරුම් ප්‍රකාශ නම් ලියවිල්ල මෙම ක්‍රමය නොවන බවද සඳහන් කළ යුතුය. එසේම ඇමරිකාව හා වෙනත් යුරෝපා රටවල පුරවැසි භාවය ලැබීමේදී අද පවා දිවුරුම් දීමක් සිදු කරන අයුරු දැකිය හැකිය.

යුරෝපයෙන් පිට අප්‍රිකානු වැනි සමාජවලද ගෝත්‍රික ජන සමාජවල නෛතික තත්ත්වය යටතේ අධිමානුෂික බලවේග ඔස්සේ විනිශ්චය ලබා ගත් බව ඒ පිළිබඳ අධ්‍යයනයෙන් පැහැදිලි වේ. විශේෂයෙන්ම දෙවියන්ගේ බලපෑම ප්‍රමුඛ වූ අතර, ඊට අමතරව මන්තර, හදිහූනියම්ද සමාජ පාලන උපක්‍රම ලෙස ක්‍රියාත්මක කරන ලදි. එසේම සමාජයේ වැදගත් පුද්ගලයෙකු මිය ගියහොත් දෙවියෙකු බවට පත් වන බවත්, හෙතෙම තරහා නොකර ගත යුතු බවත් විශ්වාස කරන ලදි. එසේ නොකර සමාජ ධර්මතා බිඳ හෙළනු ලැබුවහොත් ඔවුන්ගෙන් පළිගන්නා බවටද විශ්වාස කරන ලදි.[14] මෙහිදී මිය ගිය පුද්ගලයා ඉදිරියේ සමාජ ධර්මතා බිඳ නොහෙළන බවට පොරොන්දු වීමක් හෝ ශපථ කිරීමක් සිදු නොකරනු ලැබේ. නමුත් මිය ගිය පුද්ගලයාගේ අපේක්ෂාව එය බවත්, එසේ නොකළහොත් දඬුවම් ලැබෙන බවත් එම සමාජවල විශ්වාස්ය විය. මේ නිසා මිය ගිය අයගේ උදහසට ලක්වේය යන බිය මත සමාජ ධර්මතා බිඳ හෙළීම සිදු නොකරන ලදි.

අප්‍රිකානු සමාජවල ශපථය හා වාද විභාගද අධිකරණ විනිශ්චයේ සමාජ පාලන උපක්‍රමයක් ලෙස යොදා ගන්නා ලදි. මෙය ආගමික අතින් ඉතා වැදගත් වන අතර අධිමානුෂික බලවේග ඉදිරියේ තම නිරවද්‍යතාව ඔප්පු කිරීම මෙහි අරමුණ විය. ඒ සඳහා යාතු කර්ම වැනි ආගමික චාරිත්‍ර ඉටු කරන අයුරුද දක්නට ලැබේ. නිදසුනක් ලෙස බයිබලයේ අත ගසා දිවුරීම දැක්විය හැකිය.[15] මේ ආදී ක්‍රියාමාර්ග මඟින් ගෝත්‍රික සමාජ පාලනය වී ඇති අයුරු පැහැදිලි වේ.

11 එම

12 එම

13 එම

14 එම

15 අබේ රත්නපාල, සමාජ විද්‍යා මානව විද්‍යා න්‍යාය, (කතෘ ප්‍රකාශන,2001).

බටහිර අප්‍රිකානු ගෝත්‍රයක් වන අශාන්තිවරුන් ආරවුල් සමතයකට පත් කිරීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කරනු දක්නට ලැබේ. එහි එක් ක්‍රමයක් ලෙස වැරදි නිවැරදිභාවය විමසීම සඳහා සැකකරුට වස පානය කරවීමට සලස්වනු ලැබේ. එසේ වස පානයෙන් පසු වස වමනය කළ හොත් ඔහු නිවැරදි පුද්ගලයෙකු ලෙස සලකන ලදි. වස පානයෙන් පසු මිය ගියහොත් නිරායාසයෙන්ම ඔහු වැරදිකරුවෙකු ලෙස සලකන ලදි.[16] මේ අනුව වැරදිකරු, නිවැරදිකරු හඳුනා ගැනීමක් සිදු කළ අතර එය ඔවුන්ගේ නෛතික තත්ත්වය හා බැඳි විනිශ්චය ක්‍රමයකි. අප්‍රිකානු ගෝත්‍රික පිරිස් අතර ශපථය හා වාද විභාග ක්‍රම සංකීර්ණ සමාජ සංස්ථාවල බහුල ලෙස දක්නට ලැබේ. මෙම සමාජවල පැන නගින ආරවුල් සමතයකට පත් කර ගැනීමට නොහැකි අවස්ථාවලදී ශපථය හා වාද විභාග ක්‍රම භාවිත කරන ලදි. ඒ තුළින් සමාජය තුළ පැන නගින ගැටුම් අවස්ථා අවම කර ගැනීමටද අවස්ථාව උදා විය.

මධ්‍ය අප්‍රිකානු, සයාරේ හා සුඩාන් වැනි රාජ්‍යවල ජීවත්වන ගෝත්‍රයක් ලෙස 'අසාන්ඩේවරු' හඳුනාගත හැකිය. මොවුහුද අදෘෂ්‍යමාන බලවේග පිළිබඳ පවතින විනිශ්චය පදනම් කරගෙන පේන කීම තුළින් යම් යම් ගැටලුවලට විසඳුම් සෙවීමට උත්සාහ කරති. එදිනෙදා ජීවිතයේදී මුහුණ දෙන ලෙඩදුක් හා දේශපාලන ප්‍රශ්නවලදී පේනකරු වෙත ගොස් ප්‍රශ්න අසා ඒවාට පිළිතුරු ලබා ගැනීම මොවුන්ගේ සිරිත විය. එහිදී පේනකරු කුකුළු පැටවුන් උපයෝගී කර ගෙන ඔවුන්ට වස පොවා ඔවුන් දක්වන ප්‍රතිචාර අනුව විසඳුම් සෙවීමට උත්සාහ කෙරේ. මෙහිදී කුකුළු පැටවා මිය ගියහොත් ඇසූ ප්‍රශ්නය අනුව ඔව් හෝ නැත යන පිළිතුර ලැබේ. මෙහිදී පේන අසන්නට යන තැනැත්තා පිළිපැදිය යුතු පිළිවෙත් කිහිපයක්ද වේ. එහිදී ඔහු ස්ත්‍රී සම්භෝගයේ නොයෙදිය යුතු අතර මස් මාංශ ආහාරයට ගැනීමෙන්ද වැළකිය යුතුය. එසේ කළහොත් නිවැරදි ලෙස පේන කීමට නොහැකි වේ යැයි ඔවුන්ගේ විශ්වාසයද විය.[17]

මීට අමතරව බෝනියන් දූපතේ වැසියන්ද ගැටුම් අවස්ථාවලදී විසඳුම් ලබා ගැනීම සඳහා දිවුරුම් ක්‍රම භාවිත කරන ලදි. එහිදී ඔවුන් විත්ති පැමිණිලි දෙපක්ෂයේම අය දිවුරා වතුර භාජනයකට සමාන මහත ඇති ලුණු කැට දෙකක් දැමිය යුතුය. ඉන් ඉක්මනින් දිය වූ ලුණු කැටය අයිති තැනැත්තා වරදකරු ලෙස සලකන ලදි. සැන්ඩ්විච් දූපතෙහි වැසියන්ද ගැටුම් නිරාකරණය සඳහා දිවුරුම් ක්‍රම උපයෝගී කර ගෙන ඇත. නිශ්චල වතුර බඳුනකට අත් දැමීමෙන් අත වෙව්ලයි නම් හෝ වතුර කැළඹුනේ නම් ඔහු වැරදිකරු ලෙස සලකන ලදි'[18]

බහු වාර්ගික රටක් වන භාරතය තුළ විවිධ සම්ප්‍රධායයන් ක්‍රියාත්මක වු බව භාරතීය ඉතිහාසය අධ්‍යයනයේදී පැහැදිලි වේ. සම්ප්‍රදායික දිවුරුම් ක්‍රම සති පූජාව සත්‍යක් ක්‍රියාව ආදිය ඉන් සමහරකි භාරතය තුළ ක්‍රියාත්මක වූ ප්‍රකට දිවුරුම් ක්‍රමයක් ලෙස 'නගුල් තලයේ දිවුරීම' හැඳින්විය හැකිය. මෙය ජනප්‍රිය සහ විනෝදජනක එකක් වූ අතර රන්වන් පැහැ වනතෙක් රත් කරන ලද නගුල් තලයක් ගෙන එය චූදිතයාට දී දිවෙන් ස්පර්ශ කිරිමට සලස්වයි. දිව නොපිලිස්සිනි නම් ඔහු නිර්දෝශි වන අතර අහිංසකයෙකු ලෙස සලකා නිදහස් කර හරී.[19] කල්කටාවේ සහ මදුරාසියේ ශ්‍රේෂ්ඨාධිකරණවල කටයුතු කළ කිතුණු භක්තිකයෝ තම පක්ෂ බව හෝ විපක්ෂ බව දැක්වීමේදී ක්‍රිස්තු ධර්මය දෙස් කොට දිවුරුම් දුන්හ. තවද ඉන්දියානුවෝ උල්පතකින් ගලන දියපාරක් පූජනීය බව අඟවා තම සත්‍යවාදී බව ඔප්පු කිරීමට දිවුරුහ. මෙය ''වාජී'' නමින් හැඳින්වූ අතර, වර්තමානය වන විට ගංගා නම් ගඟේ ජලය මුල් කර දිවුරීම දක්වා විකාශනය වී ඇත.[20]

ඉතාලියේ 1679 වසර වන විට වරදකරුට තමා විසින්ම දිවුරුමක් ලබා ගැනීම තහනම් විය. මෙය ඉතාලියේ "Tutascun Code" නම් ව්‍යවස්ථා මාලාවට ඇතුළත් කොට තිබුණි.[21] මින් පැහැදිලි වන්නේ ඉතාලියේද දිවුරීම නැමැති සම්ප්‍රදාය ක්‍රියාත්මකව පැවති බවයි. විශේෂයෙන් ආරවුල් විසඳීමේදී දිවුරීම මගින් තීන්දු තීරණ ලබා ගත් බවත් උසාවියේ දී පැමිණිලි කරුවන්ගේ ජීවිත ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් විත්ති පාර්ෂවයේ දිවුරීමද අනිවාර්ය්‍යය එකක් බවට පත්ව තිබූ බව ටයිලර් සදහන් කරයි.

16 පී.ඩබ්. ජයතිලක, **නීතිය සහ නීතියේ ඉතිහාසය**, (කතෘ ප්‍රකාශන. 2012).
17 අබේ රත්නපාල, **සමාජ විද්‍යා මානව විද්‍යා න්‍යාය**, (කතෘ ප්‍රකාශන,2001).
18 බූස්සේ රේවත හිමි, **පැරණි සමාජ ලකුණ**, ( බලපිටිය: රාවණ මුද්‍රණාලය. 1952).
19 ඒ.එල්. බෂාම්, **අසිරිමත් ඉන්දියාව**, (පරි:), (කොළඹ: රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, 1962),
20 B.D. James Endell Tyler, **Oaths their origin and History**, ( London: John W.Parker, West Strand, 1834),
21 එම

ඔස්ට්‍රේලියාවේ නඩු විභාගයකදී දිවුරුම් දීම සිදු වූයේ කුරුසය ඉදිරිපිටය. ඔස්ට්‍රේලියාවේ දෙවන ජෝෂප් (1782) විසින් සමහර විශ්වවිද්‍යාලවල පැවති අරුම පුදුම දිවුරුම් ක්‍රම අවලංගු කළ බව සඳහන් වේ. මෙහිදී කිසියම් ප්‍රකාශයක් කිරීමේදී තම ප්‍රකාශය වඩා සත්‍ය බව තහවුරු කිරීම සඳහා තම දකුණු අත බයිබලය මත තබා තමා කරන ප්‍රකාශය දෙවියන් වහන්සේගේ ධර්මයේ නාමයෙන් සත්‍ය බව ප්‍රකාශ කර සිටියි. *"I swear, calling God to witness the truth of what I am going to say"* (Code of Joseph the second, 1782: sect 407).

දිවුරුම් දීමෙන් නඩු විසඳීම සම්බන්ධ තොරතුරු තවත් බොහෝ රටවලින් අනාවරණය වේ. මෙක්සිකෝවේද විනිසුරුවන් විසින් විත්ති හා පැමිණිලි දෙපාර්ශවය තීරණදායී දිවුරුම්වලට ලක්කොට තීන්දු ලබාදුන් ආකාරය *Oaths' their Origin and History* නමැති කෘතියේ B.D. Tyter සඳහන් කොට තිබේ. එහි සඳහන් ආකාරයට දෙපාර්ශවයෙන් දිවුරුම් ලබා ගැනීම සිදුවූයේ ඒ ඒ පුද්ගලයන්ගේ ඇඟිලිවලින් පොළව පිරිමැද එයින් තම දිව පිරිමැදීමෙනි. මේ තුළින් බලාපොරොත්තු වන්නේ පෘථිවියේ නාමයෙන් තමන් සත්‍ය ප්‍රකාශ කරන බව ඇඟවීමයි. එමෙන්ම ඔවුන්ගේ මේ දිවුරුම් තුළින් ඇතැම් වරදවලට හේතු සාධකද හඳුනාගත් බව කතුවරයා සඳහන් කරයි. *"If any witness ware called to take and Oath, that he should touch the ground with one of his fingers, and then to touch his tongue with the same"*

ස්කොට්ලන්තයේ පැවති අපූරු දිවුරීමේ ක්‍රමයක් මෙම අධ්‍යයනයේදී හමුවිය. සාක්ෂිකරුවන් උසාවියේදී දිවුරීම කරනු ලබන්නේ තම සාක්කුවේ ඇති ලේන්සුව ගෙන සිය මුඛයෙහි ඔබාගෙන ශුද්ධ වූ බයිබලය මත අත තැබීමෙනි. මෙයින් කියවෙන්නේ ඔහුගේ දිවුරුම් දීම වාචිකව සිදු නොවන බවකි. මෙය දකින විනිසුරුවරයා අදාළ පුද්ගලයා සත්‍ය ප්‍රකාශ කරන බව තහවුරු කර ගනී. තවද සාක්ෂිකරු පල්ලියේ දණ පුටුව මත දකුණු දණහිස තබා දකුණු අත ශුද්ධ වූ බයිබලය මත තබා දිවුරීමක් කරයි. එහිදී ඔහු ප්‍රකාශ කරනු ලබන්නේ තමා කරන ප්‍රකාශය අසත්‍ය වුවහොත් දෙවියන් වහන්සේගේ සාපය තමාටම හිමි වන ලෙසයි:

> *"You, fifteen, swear by God, and as you shall answer to God at the great day of judgement, that you will the whole truth say, and no truth conceal so far as you pass upon this assize".*[22]

ප්‍රකට විද්‍යාඥයෙකු වූ පයිතගරස් තමන් ආඝ්‍රාණය කරන වාතය හා පානය කර ජලය දෙස් වශයෙන් තබාගෙන (ඇප වශයෙන්) දිවුරුම් දී ඇත. සොක්‍රටිස් බල්ලෙකු හා සාමාන්‍ය ගසක් ඇපකර දිවුරා ඇත. සොක්‍රටීස් එසේ කර ඇත්තේ දෙවියන් වහන්සේ සාක්ෂි කොට දිවුරීම නුසුදුසු යැයි පිළිගත් නිසාවෙනි. එම නිසා එකල දෙවියන් වෙනුවට ලුණු, වතුර, වාතය, සුළඟ, පෘථිවිය සහ ස්වර්ගය දිවුරීම සඳහා සාක්ෂි වශයෙන් ගත් ස්වාභාවික වස්තූන් ලෙස සඳහන් කළ හැකිය.[23]

ඉහත කරුණු සලකා බැලීමේදී පැහැදිලි වන්නේ ලොව බොහෝ දියුණු රටවල අතීතයේදී දිවුරීම වැනි සම්ප්‍රදායික නෛතික තත්වයන් ක්‍රියාත්මකව පැවතිබවයි. ඉහත රට වලට සාපේක්ෂව ලංකාවේද දිවුරීම ක්‍රියාත්මක වූ බව මධ්‍යකාලීන ලංකා ඉතිහාසය අධ්‍යනයෙන් තහවුරු වේ. අතීතයේ සිටම අදෘශ්‍යමාන බලවේග විශ්වාස කිරීමට මිනිසා පෙළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මේවා ඒ ඒ රටවල මුල්බැස ගැනීමට හේතුවිය. මෙම සම්ප්‍රදායන් කවදා කොතනින් ආරම්භ වුයේද පිළිබඳ නිශ්චිත නිගමනයකට එලබීමට හැකියාවක් නොමැත කෙසේ වෙතත් මෙය සෑම දිවුරීමේ ක්‍රමයකම සමාන ලක්ෂණ පවතින බව පෙනෙන්නට තිබේ. යුරෝපීය සමාජය තුළ දක්නට ලැබුණු ප්‍රකට දිවුරුම් ක්‍රමයක් වු උණු ජලයට අත දමා එහි වූ ගල්කැට ඇහිදීමේ ක්‍රමය ගත් කල එය මහනුවර යුගයේ ක්‍රියාත්මක වු උණුතෙලෙහි දිවුරීමට සමාන කමක් දක්වයි. එය මහනුවර යුගයේ අධිකරණ කටයුතුවලදී බහුල වශයෙන් යොදා ගනු ලැබූ දිවුරීම් ක්‍රමයකි.

කිසියම් ආරවුලකදී විත්ති පැමිණිලි දෙපාර්ශවය සමතයකට පත් නොවන අවස්ථාවකදී උණුතෙලෙහි දිවුරීම මඟින් තීන්දු ලබා දී ඇත. උණුකරන ලද තෙල් භාජනයකට විත්ති පැමිණිලි

---

22 එම

23 එම

දෙපාර්ශවයේ සුලැගිළි ගිල්වයි. පසුව සුදු රෙදි කඩකින් බැඳ පසුදා පරීක්ෂා කරන අවස්ථාවේදී යම් අයකුගේ ඇඟිල්ල පිළිස්සී තිබුණේ නම් ඔහු හෝ ඇය වරදකරු ලෙස නම් කෙරේ. ඉඩම් ආරවුල්, ණය ගෙන නොගෙවා සිටිම, මං කොල්ලකෑම්, හදි හූනියම් වැනි අවස්ථාවලදී නඩු තීන්දු ලබා ගැනීම සඳහා මෙම දිවුරුම් ක්‍රමය භාවිත කරන ලදි(.[24] මහනුවර අවට ප්‍රදේශයවලදී අදිකාරම්වරුද දිසා සම්බන්ධයෙන් ඒ ඒ දිසාභාර දිසාපතිවරුද, නුවරකලාවියේදී වන්නියාර්වරුද සබරගමුව, සත් කොරළේ, වෙල්ලස්ස යන ප්‍රදේශවලදී මොහොට්ටාලවරුද මෙම දිවුරීම සඳහා බලය ලැබූ රාජ්‍ය නිලධාරීහු වූහ.[25]

මධ්‍යකාලීන යුරෝපයේ දක්නට ලැබුණු ගිනියම් කළ යකඩ කැබලි මත ඇවිදීමට සැලැස්වීම මඟින් දිවුරීමේ ක්‍රමය මධ්‍යකාලීන ලංකාවේද ක්‍රියාත්මක කළ බව රැල්ෆ් පීරිස් සඳහන් කරයි. හෙතම මෙකල පැවති ප්‍රධාන දිවුරීමේ ක්‍රම දෙකක් පෙන්වා දී ඇත.

1. දිවුරීමෙන් පරීක්ෂා කිරීම

2. භයානක පරීක්ෂාව

භයානක පරික්ෂාව ලෙස එය නම් කර ඇත්තේ බරපතල කායික හානි ගෙනදෙන පරික්ෂණ ක්‍රමයක් බැවිනි. නාග පරික්ෂාව හා රත් කළ යවට අල්ලා කරන දිවුරුම භයානක පරික්ෂාවට අයත් වේ. මෙම දිවුරුම මඟින් සිදු කරනු ලබන්නේ විත්ති පැමිණිලි දෙපාර්ශවයම කොළයක් මත තබන ලද රත්කළ යකඩයක් අතින් ගෙන පියවර හතක් ගමන් කර බිම දැමීමය. මෙසේ කිරීමෙන් ලැබෙන ප්‍රතිඵල අනුව විනිශ්චය ලබා දෙන ලදි.[26] තවද බයිබලය අතගසා දිවුරීම, දිවුරුම් ප්‍රකාශ නිකුත් කිරීම වැනි ක්‍රම ද මෙරට පැවති බව හඳුනා ගැනීමට පුලුවන බයිබලය වූ කලී පූජනීය වස්තුවකී එසේම ලාංකීය බෞද්ධයාට ධර්මය, බෝධිය ආදීය පූජනීය වස්තූන්ය. පැරණි දිවුරුම් ක්‍රම වල ධර්මය අතගසා දිවුරීම, බෝධිය ඉදිරිපිට දිවුරීම, දේවාලය ඉදිරිපිට දිවුරීම ආදීය එකල පැවති දිවුරුම් ක්‍රම වන අතර ඒවා යුරෝපීය දිවුරුම් ක්‍රමවලට සමානකම් දක්වයි.

මධ්‍යකාලීන අප්‍රිකානු සයාරය හා සූඩාන් රාජ්‍යය වල ජීවත් වූ අසන්ඩේවරු කුකුලු පැටවුන්ට වස පොවා එය ප්‍රතිචාර අධ්‍යනය කොට තීන්දු ලබා දීමේ ක්‍රමයට සමාන ක්‍රමයක් මෙරට පැවති බව ජනප්‍රවාද තොරතුරු වලින් පැහැදලි වේ. ලංකාවේ කුරුණෑගල ප්‍රදේශයෙන් අසන්නට ලැබුණු දිවුරීමේ ක්‍රමයක් ඊට සමාන කම් දක්වයි. කුකුළෙකු කාමරයට දමා විත්ති කරුට හා පැමිණිළි කරුට වු ස්පර්ශ කිරීමට සලස්වයි එහි දී කුකුළා කෑ ගැසුවේ නම් ඔහු වරදකරු ලෙෂ නම් කෙරේ. එය අසන්ඩේ වරුන්ගේ ඉහත ක්‍රමයට බෙහෙවින් සමානකම් දක්වයි. මෙයින් පැහැදිලි වන්නේ යුරෝපය තුළ ක්‍රියාත්මක දිවුරීමේ ක්‍රම ඊට සමගාමීව මෙරටද ක්‍රියාත්මක වු බවයි.

මධ්‍යකාලීන ලංකාවේ පැවති ප්‍රධාන දිව්රුම් ක්‍රම අටක් රොබර්ට් නොක්ස් පෙන්වා දී ඇත. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ දී ඉඩම් ආරවුල්, ණය ගෙන නොගෙවා සිටීම, මංකොල්ල කෑම්, හදි හූනියම් වැනි අවස්ථාවල දී තීන්දු ලබා ගැනීම සඳහා මෙම දිව්රුම් ක්‍රම භාවිත කරන ලදි. විශේෂයෙන් මෙබඳු ප්‍රාථමික ගණයේ නීති ක්‍රම ක්‍රියාත්මක වූයේ නඩු විසඳීමට අදාලව සාක්ෂි නොමැති අවස්ථාවල දී ය. මහනුවර අවට ප්‍රදේශවලදී අධිකාරම්වරු ද, දිසා සම්බන්ධයෙන් ඒ ඒ දිසා භාර දිසාපතිවරු ද, නුවර කලාවියේ දී වන්නියවරු ද, සබරගමුව, සත්කෝරළේ, වෙල්ලස්ස යන ප්‍රදේශවල දී මොහොට්ටාලවරු ද මෙම දිව්රීම සඳහා බලය ලැබූ රාජ්‍ය නිළධාරීහු වූහ.[27] නොක්ස්ගේ වාර්තාවට අනුව උණු තෙලෙහි දිව්රීම, වී මඟින් දිව්රීම, මැටි බඳුන් මඟින් දිව්රීම, ගොක්කොල ඇදීමෙන් දිව්රීම, පොළොවට ගැසීමෙන් හා මඩ වතුර ඉසීමෙන් දිවුරීම, කිතුල් ගස් මඟින් දිව්රීම, වී සාක්ෂි කොට දිව්රීම, දේවාලයේ දිව්රීම ආදී දිව්රුම් ක්‍රම මහනුවර යුගයේ දී ක්‍රියාත්මක වූ බව පැහැදිළි වේ.

---

24 රැල්ෆ් පීරිස්, **සිංහල සමාජ සංවිධානය**, (කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.1964).

25 පී. මනම්පේරි, **මහනුවර රාජධානියෙහි නීතිය හා අධිකරණය**, (මහරගම: සතර ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ. 1991).

26 ජෝන් ඩොයිලි, **සිංහලේ ආණ්ඩුක්‍රමය**, එච්. එම්. සෝමරත්න ඇල්ලේපොල (පරි:), (කොළඹ: සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම. 1966).

27 පී. මනම්පේරි, **මහනුවර රාජධානියෙහි නීතිය හා අධිකරණය**, (මහරගම: සතර ප්‍රකාශකයෝ සහ මුද්‍රණ ශිල්පියෝ. 1991).

දිව්රීම සඳහා බොනියන් දූපත් වැසියන් ජලය උපයෝගී කොටගත් අතර, මහනුවර යුගයේ දිව්රුම් ක්‍රම අතර ද ජලය දිව්රුම් මාධ්‍යයක් ලෙස යොදාගත් ආකාරය පෙනෙන්නට තිබේ. මඩ වතුර ඉසීම මඟින් දිව්රීම සිදු වූයේ කුඹුරු හිමිකම් සම්බන්ධයෙන් පැනනැගි ගැටළු විසඳීමේ දී ය. එහි දී සිදු වූයේ මත භේදයට තුඩු දුන් කුඹුරට විත්ති පැමිණිළි දෙපාර්ශවයම ගොස් එහි මඩ වතුර අහුරු තුන බැගින් ගෙන අදාල කුඹුරේ හිමිකාරිත්වය තමා සතු බව සපථ කිරීමෙනි.

භාරතීය සමාජය තුළ ක්‍රියාත්මක වූ දිව්රුම් ක්‍රමයක් ලෙස නගුල් තලයේ දිව්රීම සඳහන් කළ හැකි ය. මෙහි දී සිදු වූයේ රන්වන් පැහැය වනතෙක් නගුල් තලයක් රත් කොට විත්ති පැමිණිළි දෙපාර්ශවයට එය දිවෙන් ස්පර්ශ කිරීමට සැලැස්වීමෙනි. මෙම ක්‍රමය ඉහත සඳහන් යුරෝපීය දිව්රුම් ක්‍රමයට සමානකම් දක්වයි. භාරතය තුළ වාජී නම් දිව්රුම් ක්‍රමයක් පිළිබඳ බෂාම් සඳහන් කර ඇත. උල්පතකින් ගලන දිය පහරක් මේ සඳහා යොදාගෙන තිබූ අතර, වර්තමානය වනවිට එය ගංගා නම් ගඟේ ජලය මුල්කරගෙන කෙරෙන චාරිත්‍රයක් දක්වා විකාශනය වී ඇත.

මෙක්සිකෝවේ යුක්තිය පසිඳලීම සඳහා පෙනී සිටින විනිසුරුවරුන් පොළොව ඇඟිල්ලෙන් ස්පර්ශ කොට එයින් දිව ස්පර්ශ කිරීම සිදුකර ඇත. එයින් ප්‍රකාශ කෙරෙන්නේ සත්‍ය මිස අසත්‍ය සඳහා තීන්දු ලබා නොදෙන බවට පොරොන්දු වීමයි. ලංකාවේ පැවති පොළොවට අත ගසා දිව්රීම මෙම ක්‍රමයට යම් කිසි සමානකමක් දක්වයි. ඕස්ට්‍රේලියාවේ ජනතාව කුරුසය ඉදිරිපිට දිව්රීම සිදු කළ බව ඉහතින් සඳහන් කර ඇත. එය ලංකාවේ වර්තමානය දක්වා පවතින දිව්රුම් ක්‍රමලට බොහෝ සෙයින් සමානකම් දක්වන බව පෙනෙන්ට තිබේ. අතීතයේ පටන් ලාංකේය වැසියෝ තුනුරුවන් පූජනීයත්වයෙහිලා සැලකූහ. ඒ හේතුවෙන් විහාර, දේවාල, පොත්ගුල්, බෝධි දිව්රුම් පොළවල් ලෙස පවත්වාගෙන යෑමට පෙළඹුනහ. අංපිටියේ දිව්රුම් බෝධිය, දළඳ මාළිගය, ජය ශ්‍රී මහා බෝධිය, සතර මහා දේවාල ආදී පූජනීය ස්ථාන මෙසේ දිව්රුම් පොළ ලෙස භාවිත කර ඇත.

සීතා දේවිය සිය නිර්දෝෂීභාවය ඔප්පු කිරීම සඳහා සති පූජාව පවත්වන ලද්දේ හෙනගෙ ාඩපිටියේ බෝධිය අභියස බව ජනප්‍රවාදයේ සඳහන් වේ.[28] මෙයින් ප්‍රකට වන්නේ ප්‍රාග් ඓතිහාසික යුගයේ සිටම පූජනීය වස්තූන් මුල්කොටගෙන දිව්රීම සිදු වූ බවයි. ස්කොට්ලන්තයේ සාක්ෂිකරුවන්ගේ දිව්රීමේ ක්‍රමය ද මධ්‍යකාලීන ලංකාවේ භාවිත කළ බව නිකවැරටිය පොත්ගුල් විහාරය, කුරුණෑගල රිදී විහාරය, අම්පිටිය දිව්රුම් බෝධිය, හොරොව්පොතාන කපුගොල්ලෑව ආදී ස්ථානවල සිදු කෙරෙන දිව්රුම් ක්‍රම පරීක්ෂා කිරීමෙන් පැහැදිළි වේ. මේ අනුව පෙනී යන්නේ දිව්රීම සඳහා පූජනීය වස්තූන් උපයෝගී කොටගත් බවයි.

නෛතික රාමුවකින් තොරව වාචිකව දිවුරන අවස්ථා අපි කොතෙකුත් දැක ඇත්තෙමු. 'අම්මාපල්, දෙවියන්පල්, ජලය පල්, ඉර-හඳ පල්, පහන පල්, උඹ පල් ආදී වශයෙන් මෙම වාචික දිවුරීම සිදු කරයි. ග්‍රීසියේ සිටි ප්‍රකට ගණිතඥයෙකු වූ පයිතගරස් ආශ්වාස වාතය මුල්කොටගෙන දිව්රීමත්, සොක්‍රටීස් බල්ලෙකු මුල්කරගෙන දිව්රීම සිදුකොට ඇත්තේ ද ඉහත සඳහන් වාචික දිවුරීම අනුව බව පැහැදිළි වේ. මේ අනුව පෙනී යන්නේ දිව්රීම ලෝකයේ බොහෝ ජන කොට්ඨාසවල මිනිසුන් සිය ප්‍රකාශ වඩා තහවුරු කිරීමේ අටියෙන් මෙබඳු දිවුරුම් භාවිත කරන බවයි.

## සමෝධානය

නීතිය වූ කලී සර්ව බලධාරී සංකල්පයකි. එය සියල්ලට ඉහළින් ක්‍රියාත්මක වන අතර, ඇතැමෙක් නීතියේ දිව්‍යමය බලයක් පිළිබඳ විශ්වාස කරති. යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ දී සාක්ෂි විභාග අභියෝග යට ලක් කරමින් අදෘෂ්‍යමාන බලවේග ඔස්සේ යුක්තිය අපේක්ෂා කිරීමට මිනිසා පෙළඹී ඇත්තේ අනාදිමත් කාලයක සිට ය. මෙම අධ්‍යයනය තුළින් තහවුරු කරුණු සලකා බැලීමේ දී පැහැදිළි වන්නේ ලෝකයේ විවිධ රටවල ජීවත් වූ ජනතාව ප්‍රාථමික නෛතික ක්‍රමවේද අනුගමනය කිරීමට පෙළඹී ඇති ආකාරයයි. මේ සියල්ල පරීක්ෂා කිරීමෙන් පැහැදිළි වන්නේ ලංකාවේ ක්‍රියාත්මක වූ ප්‍රාථමික ගණයේ දිව්රුම් ක්‍රමවලට බෙහෙවින් සමාන දිව්රීමේ ක්‍රම ඒ ඒ රටවල ද ක්‍රියාත්මක වූ බවයි. මෙම දිව්රුම් ක්‍රම කවදා, කොතනින් ආරම්භ වූයේ ද යන්න පිළිබඳ නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකි වුවත් මේ සියල්ල එකම මූලයකින් ආරම්භ වී පසුව ඒ ඒ සමාජ පරිසරවලට ආවේණික ලක්ෂණ සහිතව ව්‍යාප්තව ඇති බවයි.

28 එච්.එම්.එස්. තුන්දෙනිය, මහනුවර විහාරවංශය.